# <u>ටෙන්ඩර් දැන්වීම</u>

**බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියස කඩ කාමර 04 ක් බදුදීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා පත් කර ගැනීමට ටෙන්ඩර් පත් කැඳවීම.**

පහත උප ලේඛන (I) විස්තර කරනු ලබන දේපළ 2026.05.12 දින සිට2027.05.11 දින දක්වා වර්ෂයක කාලයක් සඳහා බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ සභාපති නිකලන්ද වත්තේ පේෂල තුෂාර ජයසේන වන මා විසින් 2026 මැයි මස 12 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුළ දී කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබාගත හැකි ය.

**ටෙන්ඩර් පත් නිකුත් කිරීම:**

2026 මැයි මස 11 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් භාරගැනීම:**

2026 මැයි මස 12 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ සභාපති, බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට 2026 මැයි මස 12 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරීම:**

2026 මැයි මස 12 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**උප ලේඛනය (I)**

(2026.05.12 දින සිට 2027.05.11 දින දක්වා වූ වර්ෂයක කාලය සඳහා)

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන කඩ කාමරය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල (රු) | අයදුම්පත් ගාස්තුව (රු) | අවම මාසික ටෙන්ඩර් මුදල (රු) |
|---|---|---|---|---|
| 01. | **සම්පත් පියස කඩකාමර අංක 01** | 5,000.00 | 1,000.00 | 6500.00 |
| 02. | **සම්පත් පියස කඩකාමර අංක 02** | 5,000.00 | 1,000.00 | 6300.00 |
| 03. | **සම්පත් පියස කඩකාමර අංක 03** | 5,000.00 | 1,000.00 | 6300.00 |
| 04. | **සම්පත් පියස කඩකාමර අංක 04** | 5,000.00 | 1,000.00 | 5000.00 |

ටෙන්ඩර් කාලය අවසන්වූ වහාම කඩ කාමරය බලන්ගොඩ නගර සභාව වෙත භාරදිය යුතුය.

2026 අප්‍රේල් මස 20 වන දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

එන්. ඩබ්. පී. ටී . ජයසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.